සැ. යු. :- මෙම අති විශෙෂ ගැසට් පත්‍රයෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වෙන වෙනම පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1898/30 - 2015 ජනවාරි මස 21 වැනි බදාදා - 2015.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත**

4 (2) වගන්තිය යටතේ කරනු ලබන පළකිරීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්ත්ව (SMEs) සඳහා SLFRSs අනුගමනය කරන අස්තිත්ත්ව සඳහා ආයතනය විසින් දේපළ පිරියත සහ උපකරණ සඳහා විකල්ප ප්‍රත්‍යාගණනය සඳහා, විකල්පීයව සැලකිල්ලට ගැනීම - අංක 2 සම්මත කර 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත පනතේ අරමුණ සඳහා මේ සමග පළකරමි.

මෙම වෙනස්වීම් වර්ෂ දෙදහස් දාහතරේ ජනවාරි පළමුවන දින හෝ ඊට පසුව ආරම්භවන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක වේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2015 ජනවාරි මස 21 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දීය.

1A - PG 2335 (2015/01)

පරමාර්ථය

1. මෙම ........................................................................................................................................................
........................................................................................................................................................
....................................................................................................

විෂය පථය

2. දේපළ, ........................................................................................................................................................

8. දේපල, ........................................................................................................................................................
........................................................................................................................................................
ආකාරයටය ;

(අ) වත්කමේ දළ ........................................................................................................................................
........................................................................................................................................................
........................................................................................................................................................

**විකල්පීය සැලකිල්ලට ගැනීමේ ප්‍රකාශනය (SoAT) - SoAT අංක 2**

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කරන කු.ම.ප්‍ර.අ. (SMEs) සඳහා SLFRS දේපළ පිරියත උපකරණ සඳහා විකල්ප ප්‍රත්‍යාගණනය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කරන කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්ත්ව (SMEs) සඳහා (SLFRS) පිරියත දේපළ සහ උපකරණ සඳහා විකල්ප ප්‍රත්‍යාගණනය කිරීම මත විකල්පීය සැලකිල්ලට ගැනීමේ ප්‍රකාශනය (SoAT) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක සභාව 2014 අගෝස්තු මස 13 වැනි දින අනුමත කරන ලදී.

මෙම විකල්පීයව සැලකිල්ලට ගැනීමේ ප්‍රකාශය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ කර්තෘ හිමිකම ඇති ලේඛනයකි. ලබාගත් මූලාශ්‍රය පිළිගැනීම සඳහන් කිරීමට යටත්ව මෙම දැන්වීම (දැන්වීම ඒ අයුරින්ම තබාගෙන) පෞද්ගලික සහ වාණිජමය භාවිතය සඳහා පිටපත් කිරීමට අවසර ඇත. පිටපත් කිරීම සහ වාණිජ අරමුණු සඳහා හිමිකම් පිළිබඳ ඉල්ලීම් සහ විමසීම් අරුණ අල්විස් මහතා, ලේකම්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, අංක 30ඒ, මලලසේකර මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව යන ලිපිනයට ආමන්ත්‍රණය කළ යුතුය.

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කරන කුමප්‍රඅ සඳහා දේපළ පිරියත උපකරණ සඳහා විකල්ප ප්‍රත්‍යාගණනය**


| පටුන | ඡේද |
|---|---|
| පසුබිම | |
| පරමාර්ථය | 1 |
| විෂය පථය | 2 |
| මුල්වරට හඳුනාගැනීමෙන් පසු මැණීම | 3 |
| ආදායම් බදු | 16 |
| හානිකරණය ප්‍රතිවර්ත්‍ය කිරීම | 17 |
| හෙළි කිරීම් | 18 |
| සංක්‍රාන්තිය | 21 |
| බලාත්මක දිනය | 22 |


මෙම විකල්පීය සැලකිල්ලට ගැනීමේ ප්‍රකාශනයේ (SoAT) ප්‍රතිපාදන අනිවාර්ය නොවූවත් ඒවායේ විෂය පථය යටතට ගැනෙන අස්තිත්ත්ව සඳහා මෙම SoAT යේ නියමකර ඇති නිර්දේශ සමග අනුකූලවීම සඳහා දිරිගැන් වේ.

**හැඳින්වීම**

කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ අස්තිත්ත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය (SLFRS සඳහා SMEs) වරලත් ගණකාධිකාරී ආයතන පාලක සභාව වර්ෂ 2011 දී නිකුත් කරන ලදී. මෙම ප්‍රමිතය කුඩා ව්‍යාපාරවල වුවමනා සහ හැකියා අවශ්‍යතා ඉටුකරලීම සඳහා සැලසුම් කළ ස්වයං සමන්විත වන ප්‍රමිතයකි.

කු.ම.ප්‍ර.අ. සඳහා වන SLFRS යෙන් දේපළ, පිරියත සහ උපකරණ (PPE) ප්‍රත්‍යාගණනය කිරීම දැනට තහනම් වන අතර, ඒ වෙනුවට සියලුම PPE අයිතමවල යම් සමුච්චිත ක්ෂය කිරීම් සහ හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට මැනිය යුතුය. කු.ම.ප්‍ර.අ. සඳහා වන SLFRS හි (17.15 දරන කොටස) සම්පූර්ණ SLFRSs වල LKAS 16 දේපළ, පිරියත සහ උපකරණ මගින් ප්‍රත්‍යාගණන ආකෘතිය තෝරාගැනීමට අස්තිත්ත්වයන්ට අවසර දේ.

දේපළ පිරියත සහ උපකරණ මුල්වරට හඳුනාගැනීමෙන් අනතුරුව මැනීමට සම්පූර්ණ SLFRSs වලට සමාන විකල්පයක් ලෙස ප්‍රත්‍යාගණනය කිරීමට SLFRS සඳහා අවසරදීමට, මෙම විකල්පීය සැලකිල්ලට ගැනීමේ ප්‍රකාශනය කෙටුම්පත් කිරීමේදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, සංස්ථාපිත ප්‍රජාවගේ ඉල්ලීම් ගණනාවක් සැලකිල්ලට ගන්නා ලදී.

**පරමාර්ථය**

1. මෙම SoAT පරමාර්ථය වනුයේ කුමප්‍රඅ සඳහා SLFRS අනුගමනය කරන අස්තිත්වයන් සඳහා **දේපළ, පිරියත සහ උපකරණ සඳහා මුල් හඳුනාගැනීමෙන් පසු මැනීමට කු.ම.ප්‍ර.අ.** සඳහා SLFRS හි 17.15 **කොටස** සඳහා අවසර දිය හැකි විකල්ප සැලකිල්ලට ගැනීමේ ප්‍රමිතයක් නියම කිරීමය.

**විෂය පථය**

2. **දේපළ, පිරියත හා උපකරණ මුල්වරට හඳුනාගැනීමෙන් පසුව මැණීමට** මෙම SOAT ව්‍යවහාර කළ හැකිය.

**මුල්වරට හඳුනාගැනීමෙන් පසු මැනීම**

3. දේපළ, පිරියත සහ උපකරණවල සියලු අයිතමයන් මුල්වරට හඳුනාගැනීමෙන් පසුව ඒවා පිරිවැය ආකෘතිය (කු.ම.ප්‍ර.අ.) සඳහා වන SLFRS හි 17.15 කොටස) හෝ 4 වන ඡේදය තුළවන ප්‍රත්‍යාගණන ආකෘතිය අනුව අස්තිත්ත්වයක් මැනිය යුතුය.

4. සාධාරණ වටිනාකම විශ්වසනීය ලෙස මැනිය හැකි දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් වත්කමක් ලෙස හඳුනාගත් පසු එහි " වටිනාකම" ඉදිරියට ගෙන යා යුත්තේ ප්‍රත්‍යාගණනය කළ දින සාධාරණ වටිනාකමෙන් පසුව වූ යම් සමුච්චිත ක්ෂය කිරීමක් සහ පසුව වූ හානිකරණ අලාභ අඩුකිරීමෙන් පසුව වූ **ප්‍රත්‍යාගණිත වටිනාකමටය.** වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේදී සාධාරණ වටිනාකම භාවිත කරමින් නිර්ණය කරනු ලැබිය හැකි වටිනාකමට ප්‍රමාණාත්මක ලෙස ධාරණ අගය වෙනස් නොවීම සහතික වීම උදෙසා ප්‍රමාණවත් අඛණ්ඩතාවයකින් ප්‍රත්‍යාගණනය සිදුකළ යුතුය.

5. ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය සුලභව නිර්ණය කරනු ලබන්නේ වෘත්තීය සුදුසුකම් ලත් තක්සේරුකරුවන් සාමාන්‍යයෙන් කරනු ලබන ඇගයීමක් මගින් වෙළඳපොළ පදනම් සාක්ෂි මගිනි. පිරියත සහ උපකරණවල අයිතමවල සාධාරණ වටිනාකම වනුයේ සාමාන්‍යයෙන් ඇගයීමකින් නිර්ණය කරනු ලබන ඒවායේ වෙළඳපොළ වටිනාකමය.

6. දේපළ පිරිවැය සහ උපකරණ අයිතමයක සුවිශේෂී ස්වභාවය සහ එම අයිතමය කලාතුරකින් විකිණීමේ හේතුව නිසා එහි සාධරණ අගය සඳහා වෙළඳපොළ පදනම් සාක්ෂි නොමැතිවිට, අඛණ්ඩව පවත්වා ගෙනයන ව්‍යාපාරයක කොටසක් හැර, ආදායම් හෝ ක්ෂය කරන ලද ප්‍රතිසම්පාදන පිරිවැය ප්‍රවේශය භාවිතාකර එම අයිතමයේ සාධාරණ අගය ඇස්තමේන්තු කිරීමට අස්තිත්ත්වයට අවශ්‍ය විය හැකිය.

7. ප්‍රත්‍යාගණනය කරනු ලබන දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල සාධාරණ අගයන්හි වෙනස්වීම් මත ප්‍රත්‍යාගණනය කිරීමේ සංඛ්‍යාත රඳා පවතී. ප්‍රත්‍යාගණනය කරනු ලැබූ වත්කම සාධාරණ වටිනාකම එහි ධාරන වටිනාකමෙන් සැලකිය යුතු අන්දමින් වෙනස්වන විට අතිරේක ප්‍රත්‍යාගණනයක් කිරීම අවශ්‍ය වේ. දේපළ, පිරියත සහ උපකරණවල සමහර අයිතමවල සාධාරණ වටිනාකම සැලකිය යුතු සහ වෙනස්වන සුළු වෙනස්වීම් ඇත්දැකීමට සිදුවන බැවින් වාර්ෂික ප්‍රත්‍යාගණනය කිරීම අවශ්‍ය බවට පත්වේ. සැලකිය යුතු නොවන අන්දමට සාධාරණ අගය වෙනස්වන දේපළ, පිරියත සහ උපකරණ අයිතම සඳහා එවැනි නිරන්තර ප්‍රත්‍යාගණනයක් අවශ්‍ය නොකෙරේ. ඒ වෙනුවට එම අයිතම සෑම වසර තුනකට හෝ පහකට වරක් පමණක් ප්‍රත්‍යාගණනය කිරීම අවශ්‍ය විය හැකිය.

8. දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කළ විට ප්‍රත්‍යාගණනය කළ දින යම් සමුච්චිත ක්ෂය කිරීමක් පිළිබඳව ක්‍රියා කරන්නේ පහත දැක්වෙන ආකාරවලින් එක් ආකාරයකටය;

(අ) වත්කමේ දළ ධාරණ වටිනාකම වෙනස්වීම සමග සමානුපාතිකව නැවත ප්‍රකාශ කිරීම, ඒ අනුව ප්‍රත්‍යාගණනය කළ පසු වත්කමේ ධාරණ වටිනාකම එහි ප්‍රත්‍යාගණනය කළ වටිනාකමට සමාන වේ. වත්කමක එහි ක්ෂය කරන ලද ප්‍රතිසම්පාදන පිරිවැය නිර්ණය කිරීම දර්ශකයක් ව්‍යවහාර කිරීමේ විධියක් මගින් වත්කමක් ප්‍රත්‍යාගණනය කිරන විට මෙම ක්‍රමය බොහෝ විට භාවිත කෙරේ.

(ආ) සමුච්චිත ක්ෂය කිරීම දළ ධාරණ වටිනාකමට එරෙහිව ඉවත් කිරීමෙන් ශුද්ධ වටිනාකම වත්කමේ ප්‍රත්‍යාගණන වටිනාකමට නැවත ප්‍රකාශ කිරීම, මෙම ක්‍රමය බොහෝ විට භාවිත කරනුයේ ගොඩනැගිලි සඳහාය. සමුච්චිත ක්ෂය කිරීම නැවත ප්‍රකාශ කිරීම හෝ ඉවත් කිරීම මත පැන නගින ගැලපුමේ අගය ධාරණ වටිනාකම වැඩිවීමේ - අඩුවීමේ ස්වරූපය ගන්නා අතර එය ගිණුම්ගත කරනුයේ 12 සහ 13 වන ඡේද ප්‍රකාරවය.

9. දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කළහොත් එම වත්කම අයත් දේපළ, පිරියත සහ උපකරණ සම්පූර්ණ පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතුය.

10. දේපළ, පිරියත සහ උපකරණ පන්තියක් යනු එක හා සමාන ස්වභාවයේ සහ අස්තිත්ත්වයක මෙහෙයුම් සඳහා භාවිතා කරන වත්කම් කාණ්ඩ ගත කිරීමකි. වෙන්ව වූ පන්ති සඳහා උදාහරණ පහත දැක්වේ;

(අ) ඉඩම්;

(ආ) ඉඩම් සහ ගොඩනැගිලි;

(ඇ) යන්ත්‍ර;

(ඈ) නැව්;

(ඉ) ගුවන්යානා;

(ඊ) මෝටර් වාහන;

(උ) ලී බඩු සහ සවිකිරීම්; සහ

(ඌ) කාර්යාලීය උපකරණ වේ.

11. වත්කම් තෝරාගෙන ප්‍රත්‍යාගණනය කිරීම සහ වෙනස් දිනවලදී පිරිවැය සහ වටිනාකම්වල මිශ්‍රණයක් සහිත වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුළ වාර්තා කිරීම වැළැක්වීමට එක පන්තියක ඇති දේපළ, පිරියත සහ උපකරණ අයිතම සියල්ලම එකවරම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. කෙසේ වෙතත්, එක පන්තියක වත්කම් ප්‍රත්‍යාගණනය කෙටිකාල පරිච්ඡේදයක් තුළදී නිමකරන්නේ නම් සහ ප්‍රත්‍යාගණනය යාවත්කාලීනව තබාගැනීමට යටත්ව එක පන්තියක වත්කම් මාරුවෙන් මාරුවට කිරීමේ පදනම මත ප්‍රත්‍යාගණනය කළ හැකිය.

12. ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වත්කමක ධාරණ වටිනාකම වැඩිවන්නේ නම්, එම වැඩිවීම වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනා ගතයුතු සහ ස්කන්ධයේ ප්‍රත්‍යාගණන අතිරික්තය යන ශීර්ෂය යටතේ සමුච්චය කළ යුතුය. කෙසේ වෙතත් එම වැඩිවීම ලාභ හෝ අලාභවල හඳුනා ගත යුත්තේ එම වත්කම සඳහා කලින් හඳුනාගත් ප්‍රත්‍යාගණනය කිරීමේ අඩුවීමක් ප්‍රතිවර්ත්‍යවන ප්‍රමාණයටය.

13. ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වත්කමක ධාරණ වටිනාකම අඩුවන්නේ නම් එම අඩුවීම ලාභ හෝ අලාභවල හඳුනාගත යුතුය. කෙසේ වෙතත් එම වත්කම සඳහා ප්‍රත්‍යාගණන අතිරික්තයක පවතින බැර ශේෂයන් එම ප්‍රමාණය තෙක් එම අඩුවීම වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනා ගතයුතුය. වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත් අඩුවීම මගින් ප්‍රත්‍යාගණන අතිරික්තය ශීර්ෂය යටතේ ස්කන්ධයේ සමුච්චය වී ඇති ප්‍රමාණය එම වටිනාකමෙන් අඩුවේ.

14. දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් සම්බන්ධව ස්කන්ධයේ ඇතුළත් ප්‍රත්‍යාගණන අතිරික්තයේ එම වත්කම ප්‍රතිහඳුනා ගන්නා විටදී වහාම එය රඳවාගත් ඉපයීම්වලට මාරුකළ හැකිය. වත්කම විශ්‍රාම යාමේදී හෝ බැහැර කිරීමේදී, සම්පූර්ණ අතිරික්තය මාරු කිරීම මෙයට සම්බන්ධ කරගැනේ. අස්තිත්ත්වය වත්කම භාවිත කිරීමේදී අතිරික්තයේ කොටසක් මාරු කළ හැකිය. එවැනි අවස්ථාවක මාරුකරනු ලබන අතිරික්තයේ වටිනාකම විය හැක්කේ වත්කමේ ප්‍රත්‍යාගණිත වටිනාකම පදනම් කළ ක්ෂය කිරීම සහ වත්කමේ මුල් පිරිවැය පදනම මත ක්ෂය කිරීමේ ප්‍රමාණය අතර වෙනසය.

ප්‍රත්‍යාගණන අතිරික්තයෙන් රඳවාගත් ඉපයීම්වලට මාරුකිරීම ලාභ හෝ අලාභ හරහා කරනු නොලැබේ.

15. දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමෙන් ප්‍රතිඵලයක් වන ආදායම මත වන යම් බදුවල බලපෑම LKAS 12 ආදායම් බදු ප්‍රකාරව හඳුනාගෙන හෙළිදරව් කළ යුතුය.

**ආදායම් බදු**

16. කු.ම.ප්‍ර.අ. සඳහා වන SLFRS මගින් සමහර වත්කම් සාධාරණ වටිනාකමට හෝ ප්‍රත්‍යාගණිත වටිනාකම ඉදිරියට ගෙනයාමට අවසරදේ. සමහර අධිකරණ බලප්‍රදේශවල ප්‍රත්‍යාගණනය හෝ වත්කමක් සාධාරණ අගයට දක්වා වෙනත් නැවත ප්‍රකාශ කිරීමක් ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ බදු අයකළ හැකි ලාභයට (බදු අලාභ) බලපායි. එහි ප්‍රතිඵලයක් ලෙස වත්කමේ බදු පදනම ගළපන අතර තාවකාලික වෙනස්වීම් පැන නොනඟී. වෙනත් අධිකරණ බලප්‍රදේශවල වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීම හෝ නැවත ප්‍රකාශ කිරීම ප්‍රත්‍යාගණනය කළ හෝ නැවත ප්‍රකාශ කළ කාලපරිච්ඡේදයේ බදු අයකළ හැකි ආදායමට බල නොපායි හා ආනුශංගිකව වත්කමේ බදු පදනම ගළපනු නොලබයි. එසේ වුවද ධාරණ වටිනාකමේ අනාගත ආපසු අයකරගැනීමෙන් අස්තිත්ත්වයට බදු අයකළ හැකි ආර්ථික ප්‍රතිලාභය ප්‍රවාහයක් ප්‍රතිඵලයක් ලෙස ලැබෙන අතර හා බදු කාර්ය සඳහා අඩුකරගත හැකි ප්‍රමාණයෙන් එම ආර්ථික වටිනාකමේ ප්‍රමාණයෙන් වෙනස් වනු ඇත. ප්‍රත්‍යාගණිත වත්කමේ ධාරණ වටිනාකම සහ එහි බදු පදනම අතර වෙනස තාවකාලික වෙනසක් වන අතර එමගින් විලම්බිත බදු වත්කමක් හෝ වගකීමක් පැනනැගීමට තුඩු දේ. මෙය පහත දේ සඳහා වුවත් සත්‍ය වේ.

(අ) වත්කම බැහැර කිරීමට අස්තිත්වය අපේක්ෂා නොකරයි. එවැනි අවස්ථාවලදී වත්කමේ ප්‍රත්‍යාගණනය කළ ධාරණ වටිනාකම වත්කම භාවිත කිරීම මගින් ආපසු අය කරගන්නා අතර මෙමගින් අනාගත කාලපරිච්ඡේද තුළ බදු කාර්යයන් සඳහා ඉඩදිය හැකි ක්ෂය කිරීම අභිබවා යන බදු අයකළ හැකි ආදායමක් ජනනය වනු ඇත; හෝ

(ආ) වත්කම බැහැර කිරීමෙන් ලබන මුදල ඒ හා සමාන වත්කම්වල ආයෝජනය කර ඇති නම් ප්‍රාග්ධන ලාභ මත බද්ද විලම්භනය කරනු ඇත. එවැනි අවස්ථාවලදී ඒ හා සමාන වත්කම් භාවිත කිරීමෙන් හෝ විකිණීමෙන් අවසාන වශයෙන් බද්ද ගෙවිය යුතු වේ.

**හානිකරණය ප්‍රතිවර්තනය කිරීම**

17. ප්‍රත්‍යාගණනය කළ වත්කමක හානිකරන අලාභය ප්‍රතිවර්තනය කිරීම විස්තීර්ණ ආදායමේ හඳුනාගන්නා අතර එම වත්කමේ ප්‍රත්‍යාගණන සංචිතය එමගින් වැඩිවේ. කෙසේ වෙතත් එසේ කරනුයේ එසේ ප්‍රත්‍යාගණනය කළ වත්කම මතම ලාභ හෝ අලාභවල කලින් හඳුනාගත් හානිකරන අලාභයේ ප්‍රමාණය තෙක්ය. එම හානිකරණ අලාභය ප්‍රතිවර්තනය කිරීමද ලාභ හෝ අලාභවල හඳුනාගනු ලැබේ.

**හෙළි කිරීම්**

18. දේපළ, පිරියත සහ උපකරණවල කාලපරිච්ඡේදය ආරම්භයේ දී සහ අවසානයේ දී ධාරණ වටිනාකම්වල සංසන්දනය කිරීමකින් ප්‍රත්‍යාගණනයෙන් සහ වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත් හානිකරණ අලාභ හෝ ප්‍රතිවර්තනය කිරීම් මගින් ප්‍රතිඵලයක් වන වටිනාකම්වල වැඩිවීම සහ අඩුවීම් වෙනම පෙන්නුම් කළ යුතු ය.

19. දේපළ, පිරියත සහ උපකරණ අයිතම ප්‍රත්‍යාගණිත වටිනාකම්වලට සඳහන් කරන්නේ නම් පහත සඳහන් හෙළිදරව් කළ යුතු යː

(අ) ප්‍රත්‍යාගණනය බලාත්මක වන දිනය.

(ආ) ස්වාධීන තක්සේරුකරුවකු සහභාගි වූයේ ද යන්න.

(ඇ) අයිතමවල සාධාරණ අගය ඇස්තමේන්තු කිරීමේ දී ව්‍යවහාර කළ ක්‍රම සහ වැදගත් උපකල්පන.

(ඈ) සක්‍රීය වෙළෙඳපොළක නිරීක්ෂණය කළහැකි මිල ගණන් හෝ අතේදුර නියමයන් මත මෑත වෙළෙඳපොළ ගනුදෙනු වලට කෙළින්ම යොමුකර නිර්ණය කරන ලද හෝ වෙනත් තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමයක් භාවිත කර ඇස්තමේන්තු කළ අයිතමයන්ගේ සාධාරණ අගයේ තරම.

(ඉ) ප්‍රත්‍යාගණනය කළ සෑම දේපළ, යන්ත්‍ර සහ උපකරණ පන්තියක් සඳහා පිරිවැය ආකෘතිය යටතේ වත්කම ඉදිරියට ගෙනයන ලද්දේනම් හඳුනාගත හැකිව තිබූ ධාරණ වටිනාකම්.

(ඊ) කාලපරිච්ඡේදයේ සිදුවූ වෙනස්වීම් සහ ශේෂය කොටස් හිමියන්ට බෙදාහැරීමට ඇති යම් සීමාකිරීම් සඳහන් කරමින් ප්‍රත්‍යාගණන අතිරික්තය.

20. සෑම පන්තියකම වත්කම් සඳහා අස්තිත්ත්වය පහත දෑ හෙළිදරව් කළ යුතු යː

(අ) ප්‍රත්‍යාගණනය කළ වත්කම් මත කාලපරිච්ඡේදය තුළ දී වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත් හානිකරණ අලාභවල ප්‍රමාණය.

(ආ) ප්‍රත්‍යාගණනය කළ වත්කම් තුළ කාලපරිච්ඡේදය තුළදී වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත් ප්‍රතිවර්තනය කළ හානිකරණ අලාභවල වටිනකම.

**සංක්‍රාන්තිය**

21. මෙම වි.සැ.ප්‍ර.යේ (SoAT) 3 වන ඡේදයේ නියම කර ඇති ප්‍රත්‍යාගණන ආකෘතිය අනුගමනය කිරීමට අස්තිත්වයක් තෝරාගන්නා විට දී, අස්තිත්ත්වය විසින් එම ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීමේ ප්‍රතිඵලය මත වන යම් ගැළපුම් අනාගතයේ දී බලාපොරොත්තු විය හැකි පරිදි ගිණුම්ගත කළ යුතු ය.

**බලාත්මක දිනය**

22. වර්ෂ 2014 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භවන එහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල කාල පරිච්ඡේද සඳහා අස්තිත්ත්වයක් මෙම SoAT ව්‍යවහාර කළ යුතු ය.

02 - 76

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.